# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## **සමථකරණය තුළින් ඇතිවන්නා වූ** අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීමේ සහ බලාත්මක කිරීමේ

**සමථකරණය තුළින් ඇතිවන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය හෙවත් සමථකරණය පිළිබඳ සිංගප්පූරු සම්මුතිය ක්‍රියාවේ යෙදවීම පිණිස ද; අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීම සහ බලාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2023 නොවැම්බර් මස 07 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ඔක්තෝබර් මස 16 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[213 වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 24.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**එල්.ඩී.-ඕ. 42/2022**

**සමථකරණය තුළින් ඇතිවන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය හෙවත් සමථකරණය පිළිබඳ සිංගප්පූරු සම්මුතිය ක්‍රියාවේ යෙදවීම පිණිස ද; අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීම සහ බලාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

සමථකරණය තුළින් ඇතිවන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිබඳ සම්මුතිය (මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේ දී දෙදහස් දහ අට දෙසැම්බර් මස විසි වන දින සම්මත කරනු ලැබ ඉන්පසු දෙදහස් විස්ස සැප්තැම්බර් මස දොළොස්වන දින බලාත්මක වූ හෙයින් ද:

සුහදව වාණිජමය ආරාවුල් නිරාකරණය කිරීමේ ක්‍රමයක් ලෙස සමථකරණයෙහි වටිනාකම හඳුනාගැනීමෙන් සහ අන්තර්ජාතික සහ ජාතික වශයෙන් සමථකරණය භාවිත කිරීමේ වැඩිවීමක් නිරීක්ෂණය කිරීමෙන්, දෙදහස් දහනවයේ අගෝස්තු මස හත්වන දින ශ්‍රී ලංකා රජය විසින් සම්මුතියට අත්සන් තබන ලද හෙයින් ද:

අන්තර්ජාතික සමථකරණ නිරවුල් කිරීම් පිළිබඳ නෛතික රාමුවක් සම්මුතිය යටතේ පිහිටුවීම මගින්, ආරාවුල් හේතුවෙන් වාණිජමය සබඳතා අවසන් කරනු ලබන අවස්ථා අවම කරනු ලැබිය හැකි හෙයින් සහ අවිරෝධී අන්තර්ජාතික ආර්ථික සබඳතා වර්ධනය කරනු පිණිස දායක විය හැකි හෙයින් ද:

සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් බලාත්මක කිරීම සඳහා නීතිමය විධිවිධාන සැදීමට ශ්‍රී ලංකා රජයට අවශ්‍ය වී ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**1.** (1) මේ පනත 2023 අංක දරන සමථකරණය තුළින් ඇති වන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීමේ සහ බලාත්මක කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් සම්මුතිය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්

බලාත්මක වන දිනය ලෙස සහතික කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

පනත අදාළ වීම

**2.** (1) (මෙහි මින් මතු "අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම" යනුවෙන් සඳහන් කරනු ලබන) සමථකරණය තුළින් ඇති වී තිබෙන සහ වාණිජමය ආරාවුලක් විසඳීමට පාර්ශ්වයන් විසින් ඇති කරගනු ලැබූ, එය ඇති කරගනු ලබන අවස්ථාවේ දී ස්වභාවයෙන් අන්තර්ජාතික වන්නා වූ යම් ලිඛිත නිරවුල්කරණ ගිවිසුමක් සඳහා මේ පනතේ විධිවිධාන, 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අදාළ විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන යම් අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමකට අදාළ වීම ශ්‍රී ලංකා රජය විසින් සම්මුතියේ 8 වන ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි අවශේෂිතයන්හි නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රමාණයට යටත් විය යුතු ය.

මේ පනතේ විෂය පථයෙන් බැහැර කරනු ලබන නිරවුල්කරණයන්

**3.** මේ පනතේ විධිවිධාන -

(අ) (i) පෞද්ගලික, පවුලේ හෝ ගෘහස්ථ කටයුතු සඳහා පාරිභෝගිකයකු වන එක් පාර්ශ්වයක් විසින් නිරත වනු ලැබ ඇති ගනුදෙනුවක්;

(ii) පවුලේ කාරණා, උරුමය හෝ රැකියා නියුක්තිය සම්බන්ධ කාරණා,

සම්බන්ධයෙන් වන ආරාවුලක් විසඳීම සඳහා එළඹුණු නිරවුල්කරණ ගිවිසුම්; හෝ

(ආ) (i) අධිකරණ නඩු කටයුතුවල දී අධිකරණයක නඩු තීන්දුවක් ලෙස තීන්දු කරනු ලැබ ඇති වූ හෝ වාර්තා කරනු ලැබ ඇති වූ සහ අධිකරණයක නඩු තීන්දුවක් ලෙස බලාත්මක කළ හැකි වූ; හෝ

(ii) බේරුම්කරණ ප්‍රදානයක් ලෙස බලාත්මක කළ හැකි වූ,

නිරවුල්කරණ ගිවිසුම්,

සඳහා අදාළ නොවිය යුතු ය.

අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම

**4.** (අ) අවම වශයෙන්, නිරවුල්කරණ ගිවිසුමේ පාර්ශ්ව දෙකක ව්‍යාපාර ස්ථාන වෙනත් රාජ්‍යයන්හි පිහිටා තිබේ නම්; හෝ

(ආ) (i) නිරවුල්කරණ ගිවිසුම යටතේ ඇති බැඳීම්වල සැලකිය යුතු කොටසක් ඉටු කරනු ලබන රාජ්‍යයෙන්; හෝ

(ii) නිරවුල්කරණ ගිවිසුමේ විෂය කාරණය වඩාත් සමීපව සම්බන්ධ වී ඇත්තේ යම් රාජ්‍යයක් සමඟ ද එම රාජ්‍යයෙන්,

නිරවුල්කරණ ගිවිසුමේ පාර්ශ්වයන්හි ව්‍යාපාරික ස්ථාන පිහිටා තිබෙන රාජ්‍යය වෙනස් වන්නේ නම්,

නිරවුල්කරණ ගිවිසුමක් එය ඇති කරගනු ලබන අවස්ථාවේ දී ස්වභාවයෙන් අන්තර්ජාතික විය යුතු ය.

අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමේ වලංගුභාවය

**5.** 6 වන වගන්තිය යටතේ කරනු ලැබූ ඉල්ලීමක් මත මහාධිකරණය විසින් තීන්දු ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් මිස, සෑම අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමක් ම, වලංගු සහ බලාත්මක වන අතර, ඒ යටතේ පාර්ශ්වයන් විසින් භාරගනු ලබන බැඳීම් පාර්ශ්වයන් විසින් වෙනත් යම් ගිවිසුමක ආකාරයට පිළිගනු ලැබිය යුතු ය.

මහාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම

**6.** (1) අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමක පාර්ශ්වයක් විසින්. එකී අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම බලාත්මක කිරීමේ කාර්යය සඳහා එම අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම මහාධිකරණ තීන්දු ප්‍රකාශයක් ලෙස ඇතුළත් කරනු පිණිස මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලද විට, මේ පනතේ විධිවිධාන යටතේ නඩු කටයුතු කල් දැමීමට හෝ අයැද ඇති සහනය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ හේතු ඉදිරිපත් වී නැතැයි මහාධිකරණය සෑහීමට පත්වන්නේ නම්, මහාධිකරණය විසින් පාර්ශ්වයන්ට දැනුම් දෙනු ලබන දිනයක දී, අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමට අනුව නඩු තීන්දුව ඇතුළත් කිරීමට කටයුතු

කරනු ලැබිය යුතු අතර ඉන් පසුව තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මහාධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස මහාධිකරණය විසින් සටහන් කරනු ලබන අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමක් -

(අ) මහාධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දුවක හෝ සිදු කරන ලද ආඥාවක් ආකාරයට බලාත්මක කරනු ලැබිය හැකි ය; සහ

(ආ) අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමේ පාර්ශ්වයන් විසින් යම් අධිකරණ නඩු කටයුත්තක දී විත්ති වාචකයක් ලෙස හෝ හිලව් ලෙස හෝ වෙනත් යම් ආකාරයකින් යොදා ගනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ නිශ්චිතව දක්වා ඇති සියලු නඩුකර විභාග කොට තීරණය කිරීමට අධිකාරිත්වය සහ පූර්ණ බලය මහාධිකරණයට තිබිය යුතු ය.

අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම අධිකරණයේ දී සාක්ෂි වශයෙන් ආවේශනය කිරීම

**7.** අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමක් මගින් විසඳා ඇති බවට පාර්ශ්වයක් විසින් හිමිකම් පාන කාරණාවක් සම්බන්ධයෙන් යම් නඩුකරයකදී ආරාවුලක් පැන නැගෙන අවස්ථාවක දී එකී කාරණාව දැනටමත් විසඳනු ලැබ ඇති බව තහවුරු කිරීම සඳහා එකී අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම සාක්ෂි වශයෙන් ආවේශනය කරගනු ලැබිය යුතු ය.

අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් මත රඳා පැවතීම සඳහා වන අවශ්‍යතාවන්

**8.**(1) 6 වන වගන්තිය යටතේ මහාධිකරණයට ඉල්ලීමක් සිදු කරන හෝ යම් අධිකරණ නඩු කටයුත්තක දී 7 වන වගන්තියේ විධිවිධාන යටතේ සාක්ෂි වශයෙන් ආවේශනය කර ගනු ලබන අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමක් මත රඳා පැවතීමට අපේක්ෂා කරනු ලබන යම් පාර්ශ්වයක් විසින්, අවස්ථාවෝචිත පරිදි, මහාධිකරණය හෝ අධිකරණය වෙත පහත ලේඛන භාරදෙනු ලැබිය යුතු ය:-

(අ) පාර්ශ්වයන් විසින් අත්සන් තබන ලද අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමේ මුල් පිටපත හෝ නිසි ලෙස සහතික කරන ලද පිටපතක්; සහ

(ආ) අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම සමථකරණය තුළින් ඇති වූ බවට වන -

(i) අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමේ සමථකරු හෝ සමථකරුවන්ගේ අත්සන්;

(ii) සමථකරු හෝ සමථකරුවන් විසින්, අවස්ථාවෝචිත පරිදි, පහසුකම් සලසන ලද සමථකරණයේ ප්‍රතිඵලයක් ලෙස අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමට එළඹුන බවට එකී සමථකරු හෝ සමථකරුවන් විසින් සහතික කර අත්සන් තබන ලද ලේඛනයක්;

(iii) සමථකරණය ක්‍රියාත්මක කළ ආයතනය විසින් සිදු කරන ලද සහතික කිරීමක්; හෝ

(iv) (i), (ii) හෝ (iii) නොමැති අවස්ථාවක දී, අධිකරණයට පිළිගත හැකි වෙනත් යම් සාක්ෂියක්.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "අත්සන" යන්නට, ඉලෙක්ට්‍රොනික අත්සනක් ද ඇතුළත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ක්‍රියා කර ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන යම් ලේඛනයක් අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට මහාධිකරණය හෝ වෙනත් යම් අධිකරණයක් විසින් නියෝග කළ හැකි ය.

(4) අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම අධිකරණයේ භාවිත වන භාෂාවෙන් නොතිබෙන අවස්ථාවක දී, අධිකරණ භාෂාවට සිදුකරනු ලැබූ සහතික කරන ලද පරිවර්තනයක් ද සමග අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම ඉදිරිපත් කරන ලෙසට අධිකරණය විසින් නියෝග කළ හැකි ය.

(5) 4 වන උපවගන්තියේ කාර්ය සඳහා, නිල හෝ දිව්රුම් දුන් භාෂා පරිවර්තකයකු විසින් හෝ ශ්‍රී ලංකාවේ සිටින අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමට ඇතුළත් වූ රටෙහි රාජ්‍ය තාන්ත්‍රික හෝ කොන්සියුලර් නියෝජිතයකු විසින් හෝ අධිකරණය සෑහීමට පත්වන

වෙනත් යම් ආකාරයකින් එකී පරිවර්තනය සහතික කරනු ලැබිය යුතු ය.

මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම හෝ සාක්ෂි ආවේශනය හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු

**9.** (1) අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමේ යම් පාර්ශ්වයක් විසින් -

(අ) එම ගිවිසුමේ පාර්ශ්වයක් යම් අශක්නුතාවකින් පෙළෙන බව;

(ආ) අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම -

(i) ශුන්‍ය සහ බලරහිත වීම, අක්‍රිය වීම හෝ අදාළ නීතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අසමත් බව;

(ii) එහි නියම අනුව අනුගම්‍ය නොවීම හෝ අවසාන ගිවිසුම නොවන බව; හෝ

(iii) පසුව වෙනස් කරනු ලැබ ඇති බව;

(ඇ) අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමේ බැඳීම් -

(i) නිසි ලෙස ඉටුකර ඇති බව; හෝ

(ii) අපැහැදිලි හෝ වටහාගත නොහැකි බව;

(ඇ) සහනය ලබාදීම අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමේ නියමවලට පටහැනි වන බව;

(ඉ) සමථකරු විසින් සමථකරුට හෝ සමථකරණයට අදාළ වන ප්‍රමිතීන්වල බරපතළ කඩකිරීමක් සිදුකර ඇති බව හා එකී කඩ කිරීම නොතිබුණේ නම් එකී පාර්ශ්වය අන්තර්ජාතික සමථකරණ ගිවිසුමට ඇතුළත් නොවන බව; හෝ

(ඊ) සමථකරුගේ අපක්ෂපාතීත්වය හෝ ස්වාධීනත්වය පිළිබඳ සාධාරණ සැක මතුකරන තත්ත්වයන් පාර්ශ්වකරුවන් වෙත හෙළිකිරීමට සමථකරු අසමත් වූ බව සහ එසේ හෙළි කිරීමට අසමත් වීම පාර්ශ්වයකට සැලකිය යුතු බලපෑමක් හෝ අනිසි බලපෑමක් සිදු කරන ලද බව සහ එකී අසමත් වීම

ඇති නොවන්නට, එම පාර්ශ්වය අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමට නොඑළඹෙන බව,

තහවුරු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කරනු ලබන්නේ නම්, 6 වන වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන මහාධිකරණය විසින් හෝ 7 වන වගන්තිය ප්‍රකාරව සාක්ෂි ලෙස අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමක් ආවේශනය කරගනු ලබන වෙනත් යම් අධිකරණයක් විසින් හෝ සහනය ලබා දීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(2) අධිකරණය විසින් -

(අ) සහනය ලබාදීම ශ්‍රී ලංකා රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි බවට; හෝ

(ආ) ආරාවුලේ විෂය කාරණය ශ්‍රී ලංකාවේ නීති යටතේ සමථකරණය මගින් නිරවුල් කිරීමට හැකියාවක් නොමැති බවට,

තීරණය කරනු ලබන අවස්ථාවක දී ද, සහනය ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

අධිකරණ තීන්දු ප්‍රකාශය ඉවත් කිරීම

**10.** අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමේ පාර්ශ්වයක් නොමැති අවස්ථාවක දී, 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම මහාධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස සටහන් කර ඇති විට, මහාධිකරණය විසින්, එකී පාර්ශ්වයේ ඉල්ලීම මත, අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම අධිකරණ තීන්දු ප්‍රකාශයක් ලෙස සටහන් කිරීම සඳහා වන ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකි යම් හේතුවක් මත, අධිකරණ තීන්දු ප්‍රකාශය ඉවත් කළ හැකි ය.

සමාන්තර ඉල්ලීම් හෙවත් අයදුම්

**11.** 6 වන වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් සිදු කරනු ලැබ ඇති සහ එම ඉල්ලීම විභාග වෙමින් තිබෙන අවස්ථාවක සහ (මෙහි මින් මතු "සමාන්තර ඉල්ලීම" ලෙස සඳහන් කරනු ලබන) එකී අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමට අදාළ යම් ඉල්ලීමක් හෝ හිමිකම්පෑමක් වෙනත් යම් අධිකරණයකට, බේරුම්කරණ විනිශ්චය සභාවකට හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රාජ්‍යයක අධිකරණ බලය ඇති වෙනත් යම් ආයතනයකට සිදු කරනු ලැබ ඇති විට සහ එය විභාග වෙමින් පවතින අවස්ථාවක දී සහ සමාන්තර ඉල්ලීමේ නඩු විභාගය 6 වන වගන්තිය ප්‍රකාරව ඉල්ලා සිටිනු ලබන සහනය

සඳහා බලපෑ හැකි බව හෝ බලපෑමට ඉඩ ඇති බව මහාධිකරණයේ මතය වන අවස්ථාවක දී, මහාධිකරණය විසින් -

(අ) සමාන්තර ඉල්ලීමේ නඩු කටයුත්ත අවසන් වන තෙක් මහාධිකරණය ඉදිරියේ පවතින ඉල්ලීමේ තීරණය කල් දැමීම; සහ

(ආ) යම් පාර්ශ්වයක ඉල්ලීම මත, සුදුසු ඇපයක් ලබා දෙන ලෙස අනෙක් පාර්ශ්වයට නියෝග කිරීම,

සිදු කරනු ලැබිය හැකි ය.

මහාධිකරණයේ නඩු කටයුතු

**12.** (1) මේ පනතේ 6 වන වගන්තිය යටතේ මහාධිකරණය වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් සිදු කළ යුතු අතර, පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන් හැර සමථකරණයේ සියලුම පාර්ශ්වයන් එම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කළ යුතු අතර, ඔවුන්ට ඒ පිළිබඳව දැන්වීම ලබා දිය යුතු ය.

(2) පෙත්සම සහ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබූ විට, පෙත්සමෙහි දක්වා ඇති කරුණු නිශ්චය කිරීම සඳහා එකී ඉදිරිපත් කිරීමෙන් සති දෙකක් ඇතුළත දිනයක් මහාධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු අතර, වගඋත්තරකරුවන්ට ඔවුන්ගේ ප්‍රතිවිරෝධතා දැක්වීමට ඇත්නම් ලිඛිතව දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරමින් ඔවුන්ගේ ප්‍රතිවිරෝධතා දැක්වීමට දිනයක් ලබා දිය යුතු ය. එහි පිටපත් පෙත්සම්කරුට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

(3) මහාධිකරණ නඩු කටයුතුවල දී දිවුරුම් ප්‍රකාශ මගින් සාක්ෂි ලබාදිය යුතු ය:

එසේ වුව ද, මහාධිකරණය සුදුසු යයි සලකනු ලබන අවස්ථාවක දී, දිවුරුම් ප්‍රකාශ මගින් ලබා දෙන සාක්ෂිවලට අමතරව වාචික සාක්ෂි ද ලබාගත හැකි ය.

(4) අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමක් මහාධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස සටහන් කර ඇති අවස්ථාවක, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යටතේ ඇතුළත් කරනු ලැබූ තීන්දු ප්‍රකාශයකට සමාන ආකාරයෙන් එම ගිවිසුම බලාත්මක කළ හැකි අතර, ඒ අනුව අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, තීන්දු

ප්‍රකාශ ක්‍රියාවේ යෙදවීමට අදාළ එකී සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXII වන පරිච්ඡේදයේ විධිවිධාන එකී බලාත්මක කිරීමට අදාළ විය යුතු ය.

(5) මහාධිකරණය විසින්, 6 වන වගන්තිය යටතේ වන ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් මාස තුනක් ඇතුළත නඩුව විභාග කර අවසන් කළ යුතු ය.

දැන්වීම් සහ සිතාසි

**13.** පනතට අනුව යම් පුද්ගලයකු වෙත දැන්වීම් සහ සිතාසි භාර දීමට අවශ්‍ය වන අවස්ථාවක දී, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධිවිධාන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයට අනුකූලව ශ්‍රී ලංකාව තුළ හෝ පිටත එකී දැන්වීම් සහ සිතාසි භාර දීම සිදු කළ යුතු ය.

රටකට සහයෝගය ලබා දීම

**14.** 2000 අංක 39 දරන සිවිල් හා වාණිජ කාරණාවල දී අන්‍යොන්‍ය සහයෝගය ලබා දීම සඳහා වූ පනතේ විධිවිධාන, සිවිල් හා වාණිජ කාරණාවක් සම්බන්ධයෙන් වූ නඩු කටයුත්තක දී සිතාසි සහ අනෙකුත් ලේඛන භාරදීම සඳහා එම පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන යම් රටකට සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නොතීසි ආපසු කැඳවීමේ අවසන් දිනයේ දී අවසන් තීන්දු ප්‍රකාශය

**15.** 6 වන වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් සිදු කරනු ලබන අවස්ථාවක, 9 වන වගන්තිය ප්‍රකාරව එවැනි ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට හෝ 11 වන වගන්තිය ප්‍රකාරව නඩු කටයුතු කල් දැමීමට හෝ හේතු ඉදිරිපත් කර නොමැති නම්, එකී ගිවිසුමට අනුකූලව මහාධිකරණය විසින් තීන්දුවක් ලබා දීමට කටයුතු කළ යුතු අතර, නොතීසි ආපසු කැඳවීමේ අවසන් දිනයේ දී අවසන් තීන්දු ප්‍රකාශය ඇතුළත් කළ යුතු ය.

අර්ථ නිරූපණය

**16.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"ඉලෙක්ට්‍රොනික" යන්නට, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතෙහි එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ඉලෙක්ට්‍රොනික අත්සන" යන්නට, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතෙහි එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මහාධිකරණය" යන්නෙන්, පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද සහ 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණය අදහස් වේ;

"සමථකරණය" යන්නෙන්, සමථකරණ ක්‍රියාවලිය සිදු කරගෙන යනු ලබන පදනමට යොදා ගනු ලබන යෙදුම නොසලකා, ආරාවුලේ පාර්ශ්වයන් මත විසඳුමක් පැනවීමට බලය නොමැති තුන්වන පාර්ශ්ව එකක හෝ ඊට වැඩි ගණනක ("සමථකරු") සහාය ඇතිව පාර්ශ්වයන් විසින් ස්වකීය ආරාවුල සුහදව නිරවුල්කරණය කර ගැනීමට උත්සාහ කරනු ලබන ක්‍රියාවලියක් අදහස් වේ;

"පාර්ශ්වයන්" යන්නෙන්, සමථකරණයට සම්බන්ධ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුමේ පාර්ශ්වයන් අදහස් වන අතර, සමථකරණය සිදු කරනු ලබන සමථකරු හෝ සමථකරුවන් ඇතුළත් නොවේ;

"ව්‍යාපාර ස්ථානය" යන්නෙන් -

(අ) යම් පාර්ශ්වයක ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ස්ථානය;

(ආ) යම් පාර්ශ්වයකට එක් ව්‍යාපාර ස්ථානයකට වඩා තිබේ නම්, අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම ඇති කරගන්නා අවස්ථාවේ දී පාර්ශ්වයන් විසින් දැන සිටි සහ අරමුණු කරන ලද අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම මගින් විසඳනු ලැබූ ආරාවුලට සමීපතම සම්බන්ධතාවක් ඇති ව්‍යාපාරික ස්ථානය;

(ඇ) යම් පාර්ශ්වයකට ව්‍යාපාර ස්ථානයක් නොමැති නම්, එම පාර්ශ්වයේ සුපුරුදු වාසස්ථානය,

අදහස් වේ; සහ

"ලිඛිත" යන්නට, අන්තර්ගත තොරතුරු පසු අවස්ථාවක දී යොමු වී භාවිත කළ හැකි පරිදි එම තොරතුරුවලට ප්‍රවේශ විය හැකි යම් ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක් ඇතුළත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

රජයේ මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී